# ප්‍රසම්පාදන දැන්වීමයි

## අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය

## සබරගමුව පළාත් සභාව

**සබරගමුව පළාත් සභාවේ අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන කමිටු සභාපති විසින් ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය යටතේ ( NSBS ) කර්මාන්ත 20 ක් ඉටුකිරීම සඳහා මිළ ගණන් කැඳවනු ලැබේ.**

**01.**මෙම කර්මාන්ත ලේඛනය හා වැඩි විස්තර www.sg.gov.lk වෙබ් අඩවියතුල ඇති ටෙන්ඩර් දැන්වීම් වෙබ් පිටුව වෙත ගොස් හෝ www.moe.sg.gov.lk යන අධ්‍යාපන අමාත්‍යාංශ වෙබ් පිටුවට පිවිස ලබාගත හැකිය.

**02.** මෙම ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය (NSBS) යටතේ පහත සඳහන් කර්මාන්ත 20 ට අදාලව ලංසු කැඳවීම,ජාතික තරගකාරී ලංසු කැඳවීම අනුව සිදුකරනු ලැබේ. ඒ ඒ කර්මාන්තය යටතේ ඉදිරිපත්වන ලංසුකරුවන් ඒහි සඳහන් CIDA ලියාපදිංචි ශ්‍රේණිවලට අයත්වන සහ ලංසු විවෘතකරන දිනට වලංගුවන ලංසු කරුවන් වියයුතුය.

**03.** ඉහත කර්මාන්තයන්ට අදාළ ප්‍රසම්පාදන ලේඛන **2025.01.20** දින සිට **2025.02.11** දින දක්වා, සතියේ වැඩ කරන දින වල **පෙ.ව. 9.00 සිට ප.ව. 3.00** දක්වා අදාල ගාස්තු ගෙවීමෙන් පසු නිකුත්කරනු ලැබේ.මෙම ප්‍රසම්පාදන ලේඛන මෙම දිනවලදී කාර්යාල වේලාවන්තුල අමාත්‍යාංශයේදී නොමිලේ පරික්ෂාකර බැලිය හැකිය.

**04.** සියලුම ලංසුකරුවන් එක් එක් ඉදිකිරීම් සඳහා එම කර්මාන්ත ඉදිරියෙන් සඳහන් ලංසු බැඳුම්කර වටිනාකමට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියාපදිංචි,පිළිගත් වාණිජ බැංකුවකින් **2025.02.13 දින සිට 2025.06.13** දින දක්වා වලංගුවන පරිදි **ලේකම්,අධ්‍යාපන,තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.සබරගමුව පළාත් සභාව. නව නගරය,රත්නපුර** නමින් අදාල කර්මාන්තය නමට ලබාගත් ලංසු බැඳුම්කරයක් හෝ ලංසු සුරක්ෂණ මුදල ලෙස **අමාත්‍යාංශ ලේකම් වෙත අදාළ මුදල් තැන්පත් කර ලබා ගත් රිසිට් පත , ලංසුව සමග ලංසු බැඳුම්කරය ලෙස ඉදිරිපත් කළ යුතුය. ලංසු බැඳුම්කරය ඉදිරිපත් කිරීමේ දී මුදල් ගෙවා ලබාගන්නා රිසිට් පතෙහි හෝ ලංසු සුරක්ෂණයෙහි මුල් පිටපත අනිවාරයෙන්ම ඉදිරිපත්කළ යුතුය.**

සම්පූර්ණ කරන ලද එම කර්මාන්තයන්ට අදාල ලංසු **2025.02.13** වන දින **පෙ.ව.11.00** ට පෙර ලැබෙන සේ පහත ලිපිනයට **ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ** සබරගමුව පළාත් සභා සංකීර්ණයේ පළමු මහලේ පිහිටි **අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම** කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. **මිළ ගණන් බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ කර්මාන්තයේ නම සඳහන් කළ යුතුය. සෑම ටෙන්ඩරයක් සඳහාම , අනුපිටපතක් ,ඒ බව කවරයේ සඳහන් කර වෙනම කවරයක බහා ඉදිරිපත් කළ යුතුය.**

**05.**ලංසු පත් විවෘත කිරීම **2025.02.13** වන දින **පෙ.ව.11.00** ට සිදුකරනු ලබන අතර, ලංසු කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගී විය හැකිය.

**06.** මෙම ලංසු කැඳවීම සම්බන්ධයෙන් පැන නගින ඕනෑම ගැටළුවක් සම්බන්ධයෙන් කාර්යාල වේලාවන් තුලදී අවශ්‍ය විස්තර අමාත්‍යාංශ කාර්යාලයෙන් **දුරකතන අංක 045 -2222542, ෆැක්ස් 045-2228042 සහ ඊමේල් edusabaram@gmail.com** මගින් ලබා ගත හැකිය. ටෙන්ඩර් පත් සම්පූර්ණයෙන් හෝ කොටස් වශයෙන් හෝ භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති සතු වේ.

| අනු අංකය | වැඩ විස්තරය | විධායක ඉංජිනේරු කාර්යාලය | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු රු. | ලංසු බැදුම්කර වටිනාකම රු. | ඉල්ලුම් කල හැකි ලියාපදිංචි ශ්‍රේණි | ඇස්තමේන්තුගත වැඩ වටිනාකම රු.මි. |
|---|---|---|---|---|---|---|
| 1 | ර/මාරපන මහා විද්‍යාලයේ 75*35 දෙමහල් ප්‍රාථමික ඉගෙණුම් සම්පත් මධ්‍යස්ථානය ඉතිරිවැඩ ඉදිකිරීම | පැල්මඩුල්ල | 3,500.00 | 97,000.00 | C-7 සහ ඉහල | 9.73 |
| 2 | ර/ලෙල්ලොපිටිය රාහුල විද්‍යාලයේ 50*25 තෙමහල් පංතිකාමර ගොඩනැගිල්ල ඉතිරිවැඩ ඉදිකිරීම | පැල්මඩුල්ල | 7,500.00 | 162,000.00 | C-6 සහ ඉහල | 16.27 |
| 3 | ර/ඇඹ/දෙමුවාත මහා විද්‍යාලයේ තාක්ෂණික හා උපදේශණ ඒකකය ඉතිරිවැඩ ඉදිකිරීම | පැල්මඩුල්ල | 7,500.00 | 328,000.00 | C-6 සහ ඉහල | 32.81 |
| 4 | ර/ඇඹ/බිබිලේගම මහා විද්‍යාලයේ 75*35 දෙමහල් ප්‍රාථමික ඉගෙණුම් සම්පත් මධ්‍යස්ථානය ඉතිරිවැඩ ඉදිකිරීම | පැල්මඩුල්ල | 7,500.00 | 202,000.00 | C-6 සහ ඉහල | 20.27 |
| 5 | ර/නව නගර කුමර විද්‍යාලයේ තාක්ෂණික හා උපදේශණ ඒකකය ඉතිරිවැඩ ඉදිකිරීම | රත්නපුර | 7,500.00 | 182,000.00 | C-6 සහ ඉහල | 18.26 |
| 6 | ර/නිවි/හවුපේ දෙමළ විද්‍යාලයේ ආපනශාලාව ඉතිරි වැඩ ඉදිකිරීම | පැල්මඩුල්ල | 2,500.00 | 46,000.00 | C-8 සහ ඉහල | 4.59 |
| 7 | ර/නිවි/හවුපේ දෙමළ විද්‍යාලයේ ප්‍රාථමික ද්විතික විද්‍යාගාරය ඉතිරි වැඩ ඉදිකිරීම | පැල්මඩුල්ල | 7,500.00 | 138,000.00 | C-6 සහ ඉහල | 13.85 |
| 8 | ර/කිරිඇල්ල මධ්‍ය මහා විද්‍යාලයේ ආපනශාලාව සහ සෞන්දර්යය ඒකකය සහිත 90*25 තෙමහල් ගොඩනැගිල්ල ඉතිරි වැඩ ඉදිකිරීම | රත්නපුර | 7,500.00 | 296,000.00 | C-6 සහ ඉහල | 29.63 |
| 9 | ර/නිවි/පොතුපිටිය මහා විද්‍යාලයේ තාක්ෂණික හා උපදේශණ ඒකකය ඉතිරිවැඩ ඉදිකිරීම | කලවාන | 3,500.00 | 96,000.00 | C-7 සහ ඉහල | 9.63 |
| 10 | ර/පාතකඩ බෞද්ධ විද්‍යාලයේ 75*35 දෙමහල් ප්‍රාථමික ඉගෙණුම් සම්පත් මධ්‍යස්ථානය ඉතිරිවැඩ ඉදිකිරීම | පැල්මඩුල්ල | 2,500.00 | 59,000.00 | C-8 සහ ඉහල | 5.96 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| **11** | ර/නිවි/ඇන්දාන ප්‍රාථමික විද්‍යාලයේ ගුරු නේවාසිකාගාරය ඉතිරිවැඩ ඉදිකිරීම | පැල්මඩුල්ල | 7,500.00 | 156,000.00 | C-6 සහ ඉහල | 15.63 |
| **12** | ර/කහවත්ත ශ්‍රී ක්‍රිෂ්ණ මහා විද්‍යාලයේ තාක්ෂණික හා උපදේශණ ඒකකය ඉතිරිවැඩ ඉදිකිරීම | පැල්මඩුල්ල | 7,500.00 | 167,000.00 | C-6 සහ ඉහල | 16.71 |
| **13** | ර/ඇඹි/මාදම්පේ විජය මහා විද්‍යාලයේ දෙමහල් විදුහල්පති නිල නිවස ඉතිරි වැඩ ඉදිකිරීම | පැල්මඩුල්ල | 3,500.00 | 110,000.00 | C-7 සහ ඉහල | 11.02 |
| **14** | කෑ/අඹේපුස්ස මහා විද්‍යාලයේ තාක්ෂණික හා උපදේශණ ඒකකය ඉතිරිවැඩ ඉදිකිරීම | කෑගල්ල | 7,500.00 | 150,000.00 | C-6 සහ ඉහල | 15.02 |
| **15** | කෑ/මාව/පරාක්‍රම මහා විද්‍යාලයේ රැස්වීම් ශාලාව සහිත 110*25 දෙමහල් පංතිකාමර ගොඩනැගිල්ල ඉතිරි වැඩ ඉදිකිරීම | රඹුක්කන | 3,500.00 | 92,000.00 | C-7 සහ ඉහල | 9.24 |
| **16** | කෑ/රංවල මහානාග මහා විද්‍යාලයේ 140*35 තෙමහල් පාසල් ගොඩනැගිල්ල (ප්‍රාථමික ඉගෙණුම් සම්පත් මධ්‍යස්ථානය,ප්‍රාථමික ද්විතියික විද්‍යාගාරය,තාක්ෂණ ඒකකය) ඉතිරි වැඩ ඉදිකිරීම | කෑගල්ල | 12,500.00 | 565,000.00 | C-5 සහ ඉහල | 56.53 |
| **17** | කෑ/වරකාපල ගාමිණී මහා විද්‍යාලයේ තාක්ෂණික හා උපදේශණ ඒකකය ඉතිරිවැඩ ඉදිකිරීම | කෑගල්ල | 7,500.00 | 264,000.00 | C-6 සහ ඉහල | 26.41 |
| **18** | කෑ/කොබ්බෑවල කීර්තිරත්න විද්‍යාලයේ 75*35 දෙමහල් ප්‍රාථමික ඉගෙණුම් සම්පත් මධ්‍යස්ථානය ඉතිරිවැඩ ඉදිකිරීම | කෑගල්ල | 7,500.00 | 237,000.00 | C-6 සහ ඉහල | 23.71 |
| **19** | කෑ/බෝයගම මහා විද්‍යාලයේ 75*35 දෙමහල් ප්‍රාථමික ඉගෙණුම් සම්පත් මධ්‍යස්ථානය ඉතිරිවැඩ ඉදිකිරීම | කෑගල්ල | 7,500.00 | 259,000.00 | C-6 සහ ඉහල | 25.93 |
| **20** | කෑ/දෙහි/ශ්‍රී සීලානන්ද මහා විද්‍යාලයේ 40*20 ආපනශාලාව ඉතිරි වැඩ ඉදිකිරීම | කෑගල්ල | 2,500.00 | 64,000.00 | C-8 සහ ඉහල | 6.43 |

**07. සියළුම ලංසු 2025.05.14 දින දක්වා වලංගු විය යුතුය.**

**08.**මෙම සියළු කර්මාන්තයන්ට අදාල පූර්ව ලංසු සාකච්ඡාව **2025.01.29** දින පෙ.ව.**10.30** ට අධ්‍යාපන අමාත්‍යාංශයේදී පවත්වනු ලැබේ. ලංසු කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට එම අවස්ථාවට සහභාගී විය හැකිය.

සභාපති
ප්‍රසම්පාදන කමිටුව,
ලේකම්
අධ්‍යාපන,තොරතුරුතාක්ෂණ හා
සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
සබරගමුව පළාත් සභාව,
නව නගරය, රත්නපුර

2025.01.20